# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2028/45 - 2017 ජූලි මස 19 වැනි බදාදා - 2017.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, 2017 ජූලි මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 ජූලි මස 19 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

උපලේඛනය

1. එම නිවේදනයෙහි ''ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍ය (අංක 3)'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 10 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

''11. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතට අදාළ සියලුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම

12. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අතිකුත් සියලුම විෂයයන්

13. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම''



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*(ආ)* එහි II වැනි තීරුවෙහි ''1. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය (අමාත්‍යාංශයේ මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ ආයතනයකි)'' යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

''2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය''

*(ඇ)* එහි III වැනි තීරුවට පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

''අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත (2016 අංක 14)''

08-152

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.